ස්වයං බිත්තර වී නිෂ්පාදනය යනු ඉදිරි කන්නය සඳහා අවශ්‍ය තත්වයෙන් උසස් බිත්තර වී තම කුඹුරේම කොටසක තමන්ම නිෂ්පාදනය කර ගැනීමයි.

වැඩි අස්වැන්නක් සඳහා තත්වයෙන් උසස් බිත්තර වී අවශ්‍යමයි.

තත්වයෙන් උසස් බිත්තර වී වල ප්‍රධාන ලක්ෂණ,

- පැළවීම ඉතා හොඳයි
- වල් බීජ නැති තරම්ය
- අපද්‍රව්‍ය නොමැත
- වෙනත් වී වර්ග කලවම් නැත
- රෝග පළිබෝධ නොමැත
- බීජ පැහැපත්ය

## ඔබට අවශ්‍ය බිත්තර වී ඔබ විසින්ම නිපදවා ගන්නේ නම් ...

- බිත්තර වී සොයා ගැනීමට වැයවන මුදල, කාලය සහ ශ්‍රමය ඉතිරි කරගත හැක
- ඔබ නිපදවාගත් බිත්තර වී වල තත්වය සම්බන්ධව ඔබට සෑහීමකට පත්විය හැක
- ඔබගේ අවශ්‍යතාවයට වඩා බිත්තර වී නිපදවන්නේ නම් එම අතිරික්තය විකුණා අමතර ආදායමක් ලබාගත හැක

## ස්වයං බිත්තර වී නිෂ්පාදනය

- මේ සඳහා කුඹුරේම හොඳින් හිරු එළිය වැටෙන පාංශු ගැටළු නොමැති ජල පහසුකම් ඇති කොටසක් වෙන්කර ගන්න
- නිර්දේශිත ආකාරයට බිම් සැකසීම, පොහොර යෙදීම, වගාව ස්ථාපනය කිරීම, ජල පාලනය ගැන විශේෂ අවධානයක් යොමු කර, බිත්තර වී කොටුව නඩත්තු කරන්න
- වල් හැමවිටම සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට විශේෂ අවධානයක් යොමු කරන්න

## පාරිශුද්ධතාවය රැකීම

ඔබ වගා කළ වී වර්ගයට වඩා,

- උස
- මිටි
- කලින් පීදෙන
- පසුව පීදෙන
- පත්‍රවල, කරලේ හා ඇටවල පැහැය වෙනස්
- පත්‍ර කොපුවේ පැහැය වෙනස් ගොයම් ගස් වෙනත් වර්ගවලට අයත් විය හැකි බැවින් ස්වයං බිත්තර වී කොටුවේ ඉහත ලක්ෂණ ඇති පඳුරු ඉවත් කරන්න

## අස්වනු නෙළීම

- කරලේ ඇට වලින් 85% ක් පමණ රන්වන් පැහැය ගත්විට අස්වැන්න නෙලන්න
- මෙයට වඩා වැඩි කාලයක් ගත වුවහොත් අස්වැන්නට හානි සිදු වේ
- වෙනත් වර්ග සමඟ මිශ්‍ර නොවන සේ බීජ වෙන් කර ගන්න
- බීජ වෙන්කිරීම සඳහා කුඩා කොලමඬින යන්ත්‍රයක් භාවිතා කිරීම වඩා සුදුසුය
- බීජ වෙන් කර ගැනිමේදී බිම් අතුරුණුවක් (ගෝනි පඩංගුවක්) භාවිතා කිරීම වඩාත් සුදුසුය
- බීජවල තෙතමනය 13% ක් පමණ වන තුරු හොඳින් වේලා ගන්න. වී ඇටයක් හපා බැලිමෙන් (ටකස් ගා දෙකට කැඩේ නම්) ප්‍රමාණවත්ව වේලී ඇති බව ඔබටම තහවුරු කරගත හැක
- හොඳින් පිරිසිදු කරගත් වී අව්වේ වේලා උණුසුම ඉවත් වනතුරු මද පවනේ තබා පිරිසිදු මළුවල අසුරන්න
- වී ප්‍රභේදය කුමක්දැයි ඇසුරුමේ ලියා තබන්න

## කල් තබා ගැනීම

- වියළි, සිසිල් හා පිරිසිදු ස්ථානයක අසුරා තැබීම සුදුසුය

- බිම නොගෑවෙන ලෙස ලෑලි තට්ටුවක් මත බීජ මළු එකිනෙකට නොගෑවෙන ලෙස අසුරන්න
- ඇසුරුම් වැස්සෙන්, පින්නෙන්, අව්වෙන් සහ උණුසුමෙන් ආරක්ෂා කර ගන්න
- ඇසුරුම් තබා ඇති ස්ථානයට හොඳ වාතාශ්‍රයක් අවශ්‍ය වේ.
- කෘමි හානි වළක්වා ගැනීමට පරීක්ෂාකාරී වන්න

කි.ග්‍රෑ. 1ක බීජ ප්‍රමාණයකින් බිත්තර වී,

- වැපිරීමෙන් බීජ කිලෝ 40ක්
- පැරෂුට් ක්‍රමයෙන් බීජ කිලෝ 100ක් පහසුවෙන් නිපදවා ගත හැක

**ඔබේ කුඹුරට අවශ්‍ය බිත්තර වී ඔබම නිපදවා ගන්න ...**



## සටහන්

........................................................................

........................................................................

........................................................................

........................................................................

........................................................................

........................................................................

........................................................................

........................................................................

........................................................................

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි**

වැඩි විස්තර සඳහා
ඔබ ප්‍රදේශයේ
කෘෂිකර්ම උපදේශක
**හමුවන්න**

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya. Printed by: AGRICULTURE PRESS

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016 - 2018

# ස්වයං බිත්තර වී නිෂ්පාදනයට අත්වැලක්



කෘෂිකර්ම අමාත්‍යාංශය
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය